# ආර්ථික විද්‍යාව

## 10.3 : විදේශ සම්පත් පරතරය හා විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව

### විදේශ සම්පත් පරතරය

නිශ්චිත කාලච්ඡේදයක් තුළ ආර්ථිකයට ගලා එන සියලු විදේශ ලැබීම් සහ ආර්ථිකයෙන් බැහැරට ගලා යන සියලු විදේශ ගෙවීම් අතර වෙනස විදේශ සම්පත් පරතරය ලෙස හඳුන්වයි.

**විදේශ සම්පත් පරතරය = විදේශ ලැබීම් - විදේශ ගෙවීම්**

විදේශ ලැබීම් ලෙස සලකන්නේ අපනයන, සේවා ලැබීම්, ප්‍රාථමික ආදායම් ලැබීම් සහ ද්විතීයක ආදායම් ලැබීම් ය. විදේශ ගෙවීම්වලට ආනයන ගෙවීම්, සේවා ගෙවීම්, සාධක ආදායම් ගෙවීම් සහ ණය ආපසු ගෙවීම්, පෞද්ගලික ප්‍රාග්ධන සංක්‍රාම ගෙවීම්, ආයෝජන ගලායාම්, වාණිජ බැංකු වල ගෙවීම් ඇතුලත් වේ.

කල්පිත ආර්ථිකයක විදේශ ලැබීම් හා විදේශ ගෙවීම් පහත දැක්වේ.

| විදේශ ලැබීම් (රු. බිලියන) | | විදේශ ගෙවීම් (රු. බිලියන) | |
|---|---|---|---|
| අපනයන ඉපැයුම් | 500 | ආනයන ගෙවීම් | 110 |
| සේවා ලැබීම් | 50 | සේවා ගෙවීම් | 50 |
| ප්‍රාථමික ආදායම් ලැබීම් | 80 | ප්‍රාථමික ආදායම් ගෙවීම් | 150 |
| ද්විතීයික ආදායම් ලැබීම් | 100 | පෞද්ගලික ප්‍රාග්ධන සංක්‍රාම ගෙවීම් | 70 |
| | | ණය ආපසු ගෙවීම් | 260 |
| | | ආයෝජන ගලා යාම් | 40 |
| | | වාණිජ බැංකුවල ගෙවීම් | 60 |
| සමස්ත විදේශ ලැබීම් | 730 | සමස්ත විදේශ ගෙවීම් | 740 |

විදේශ සම්පත් පරතරය = 730 - 740

= -10

විදේශ සම්පත් පරතරය සෘණ හෝ ධන අගයක් විය හැක. එය ශ්‍රී ලංකාවේ සෘණ අගයකි (හිඟයකි). ඊට හේතු කිහිපයකි.

- අපනයනවලට සාපේක්ෂ ව ආනයනය වැඩි අගයක් ගැනීම
- ප්‍රාථමික ආදායම් ලැබීම්වලට සාපේක්ෂ ව ප්‍රාථමික ආදායම් ගෙවීම් අධික වීම
- ණය ආපසු ගෙවීම් අධික වීම
- වාණිජ බැංකු විසින් විදේශ රටවලට කරන ගෙවීම් ප්‍රමාණය ඉහළ යාම

විදේශ සම්පත් පරතරය හිඟ වූ විට ආර්ථිකය වෙත පහත ප්‍රතිවිපාක ඇති වේ.

– විදේශ වත්කම් ප්‍රමාණය පහළ යාම

– විදේශ ණය ගැනීමට සිදු වීම

– මුදලේ විදේශ අගය පහළ යාම

– මුදල් සැපයුම පහත වැටීම

– විදේශ ණය සේවා කරන ගෙවීම් ඉහළ යාම

– ජාත්‍යන්තර ණය අර්බුදවලට පාත්‍ර වීම

විදේශ සම්පත් පරතරයෙහි සාපේක්ෂ ප්‍රමාණය මැන දක්වනු ලබන්නේ,

- දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂ ව සහ
- මුළු විදේශ ඉපයුම්වලට සාපේක්ෂවයි.

මෑත වර්ෂවල විදේශ සම්පත් පරතරය පිය වූ ආකාරය

– කෙටි කාලීන ණය

– සැපයුම්කරුවන්ගෙන් ගන්නා ණය

– බැංකු ණය

– ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගන්නා ණය

ශ්‍රී ලංකාව පහළ ආදායම් ලබන රටක් ව පැවති කාලයේ දී මෙරටට ලැබෙන විදේශ ප්‍රදාන විදේශ ආධාර විදේශ ඍජු ආයෝජන වැනි ණය නොවන මූලාශ්‍රවලින් විදේශ සම්පත් පරතරයේ සැලකිය යුතු ප්‍රමාණයක් පියවාගත් නමුත් ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන රටක් ලෙස වර්ග කිරීම නිසා ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ප්‍රදාන ආධාර සීමා වී ඇත. එබැවින්,

– කෙටි කාලීන ණය

– වාණිජ බැංකු ණය

– සැපයුම්කරුවන්ගෙන් ණය

– ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගන්නා ණය

වැනි මාර්ගවලින් ණය ලබා ගෙන විදේශ සම්පත් පරතරය පියවීමට සිදු වී තිබේ. එහි අහිතකර ප්‍රතිවිපාක වන්නේ පොළී පිරිවැය අධික වීම කෙටි කාලයක් තුළ ණය පියවීමට සිදු වීම නිසා විදේශ වත්කම් ප්‍රමාණය ශීඝ්‍රයෙන් අඩු වීම වැනි ආදිය යි.

## විදේශ වත්කම්

විදේශ වත්කම් යනු කිසියම් රටක් වෙනුවෙන් වෙනත් රටවල මහ බැංකුවල තැන්පත් කර තිබෙන විදේශ මුදල් හා සුරැකුම් පත් ය. විදෙශ් වතක් ම් ශ්‍රී ලංකා මහ බැංකුවෙත්, තැන්පතු භාරගන්නා ආයතනවලත් ශ්‍රී ලංකා රජයත් සතු ව පවතී. මෙයින් ආණ්ඩුව, මහ බැංකුව සහ වාණිජ බැංකුවලට අයත් වත්කම් දළ මුළු වත්කම් වේ. එයින් ආණ්ඩුව සහ මහ බැංකුව සතු විදේශ වත්කම් දල නිල වත්කම් වේ.

## විදේශ වත්කම්වල සංයුතිය

- මහ බැංකුව සතු විදේශ බැංකු තැන්පතු
- මහ බැංකුව මිල දී ගත් විදේශ සුරැකුම් පත්
- ශ්‍රී ලංකා රජය සතු විශේෂ ගැනුම් හිමිකම්
- වාණිජ බැංකු සතු විදේශ ව්‍යවහාර මුදල්
- වාණිජ බැංකු මිල දී ගත් විදේශ සුරැකුම් පත්

## විදේශ වත්කම්වල හිමිකම

| ආයතනය | මුළු විදේශ වත්කම්වලින් හිමි කර ගත් ප්‍රතිශතය (%) |
|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව | 73 |
| තැන්පතු භාර ගන්නා ආයතන | 22 |
| ශ්‍රී ලංකා රජය | 5 |
| | 100 |

රටකට විදේශ වත්කම් පවත්වා ගැනීම වැදගත්වන ආකාරය.

- මුදලේ විදේශ අගය ස්ථාවර ව පවත්වා ගෙන යාමට
- මුදල් සැපයුම තීරණය කිරිමට
- ආනයන ශක්‍යතාව පිරික්සීමට
- ගෙවුම් ශේෂ හිඟය පියවීමට
- මූල්‍ය අධිකාරියට විදේශ විනිමය වෙළෙඳපොළට බලපෑම් කිරීමේ හැකියාව තීරණය වීමට
- විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය දිනාගත හැකි වීමට

## මුළු විදේශ වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම

රටකට හිමි විදේශ වත්කම්වල සාපේක්ෂ ප්‍රමාණය මනිනු ලබන්නේ විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව කොපමණ කාලයක් සඳහා ප්‍රමාණවත් වේ ද යනන් මතයි. නැතිනම් විදේශ වත්කම් වල ආනයන හැකියාව මාස කොපමණකට ද යන්න මිනුම් කිරීමයි. එය ගණනය කරනු ලබන්නේ පහත පරිදි ය.

$$\text{විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව (මාස)} = \frac{\text{විදේශ වත්කම් ප්‍රමාණය}}{\text{මාසික ආනයන වියදම}}$$

උදා -

| | |
|---|---|
| රටකට හිමි විදේශ වත්කම් ප්‍රමාණය | = රු. බිලියන 60000 |
| වාර්ෂික ආනයන වියදම | = රු. බිලියන 12000 |
| විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව (මාස) | $= \frac{60,000}{12000}$ |
| | = මාස 5 |

මින් අදහස් කරන්නේ මාස 5 කට භාණ්ඩ හා සේවා ආනයනය කිරීම සඳහා විදේශ වත්කම් ප්‍රමාණවත් වන බව යි.

ශ්‍රී ලංකාවේ මෑත වසරවල විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව.

| වර්ෂය | විදේශ වත්කම්ව ආනයන ශක්‍යතාව (මාස) |
|---|---|
| 2011 | 4.3 |
| 2012 | 4.7 |
| 2013 | 4.8 |
| 2014 | 5.1 |
| 2015 | 4.6 |
| 2016 | 3.8 |
| 2017 | 4.6 |
| 2018 | 3.7 |